Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**දෙවන වාර පරීක්ෂණය 2019**

**8 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 හා 04 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ආරක්ෂක නිලධාරියාට පාසලට එන අය පිළිබඳව ඇහැගහගෙන සිටින්නැ'යි උපදෙස් ලැබිණි.

(i) නිශ්ශබ්දව (ii) දැඩි අවධානයෙන් (iii) සාවධානව (iv) අලස නොවී

02 මේ දිනවල රටේ සංවර්ධන කටයුතු ඉබි ගමනින් සිදුවනවා යැ යි විචාරකයෝ පවසති.

(i) ඉබ්බන් මගින් (ii) ඉතා වේගයෙන් (iii) ඉතා සෙමෙන් (iv) ඉතා හොඳින්

03 දියුණු වන ලෝකයත් සමග ආචීර්ණ කල්පිත අදහස් නොගැලපෙන බව මුරුගේෂන් ප්‍රකාශ කළේ ය.

(i) ප්‍රාථමික අදහස් (ii) වැඩිහිටි අදහස් (iii) අවිධිමත් අදහස් (iv) ඉපැරණි අදහස්

04 ''ඉදින් තොපට දරු පෙමෙක් ඇත්නම් තපස් හානි නොසලකා මහණ ගොයම්හු කරා ගොසින් ඊට උපදෙස් විචාරව'යි'' කිවුය.

(i) ඇදුරුතුමා (ii) නෙළුම්මල් නෙලන්නෝ

(iii) වී වපුරන ගොවියෝ (iv) බුදුන් වහන්සේ

- **ප්‍රශ්න අංක 05, 06, 07 ප්‍රශ්නවල දී ඇති පද අතුරින් නොගැළපෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

05 (i) නිශාකර (ii) සොමි (iii) දිනකර (iv) සිසි

06 (i) මිහිකත (ii) මහිලාව (iii) වනිතාව (iv) කත

07 (i) නුවන (ii) අක්ෂිය (iii) නේත්‍රය (iv) නුවණ

- **ප්‍රශ්න අංක 08, 09 ප්‍රශ්නවල සඳහන් පද පේළිවල අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

08 (i) නිස්ක්‍රිය (ii) නිශ්පාදන (iii) දෛවය (iv) දොඩමලු

09 (i) ප්‍රස්වාස (ii) සමස්ත (iii) විශිස්ඨ (iv) ස්කන්ද

10 සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ලඹය (ii) එළුවා (iii) සුවඳ (iv) අඟල

11 මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුණු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කනිෂ්ඨ (ii) පෘථුල (iii) ඡන්දය (iv) විනිශ්චය

12 පහත සඳහන් ප්‍රකාශනයෙහි ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.

''ඉඳා, ඉක්මනට කඩයට ගිහිල්ලා නූල් රෝද දෙකක් අරන් වරෙන්.''

(i) ආශිර්වාද ක්‍රියා පදයකි. (ii) ප්‍රයෝජ්‍ය ක්‍රියා පදයකි.

(iii) විධි ක්‍රියා පදයකි. (iv) පූර්ව ක්‍රියා පදයකි.

- **ප්‍රශ්න අංක 13, 14, 15 ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

13 ආශිර්වාද ක්‍රියා පදයකට උදාහරණයකි.

(i) රැගෙන (ii) වැජඹෙත්වා (iii) නට නටා (iv) ලියවයි

14 නිවැරදිව නාම ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කොට ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) මිනිස් + ආ (ii) පොත + අ (iii) පුත + අණු (iv) බල් + ආ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

15 ජාති නාම පදයකට උදාහරණයකි.

(i) යකඩ (ii) අමල් (iii) ලියවිලි (iv) දොඩම්

- **ප්‍රශ්න අංක 16, 17 ප්‍රශ්නවල සඳහන් හිස්තැන් පිරවීමට සුදුසු ක්‍රියාපදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

16 තොපි අලුත් අවුරුදු නිවාඩුව සතුටින් ගත .......................... (කළෙහි / කළෙහු)

17 සියලු සත්වයෝ දුකින් ............................... (මිදෙත්වා ! / මිදෙහුවා !)

18 පහත සඳහන් පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(i) උච්ච - ........................................ (ii) ජ්‍යෙෂ්ඨ - ........................................

19 පහත සඳහන් පද සඳහා යෙදෙන තනි පදය හිස්තැන් තුළ ලියන්න.

(i) උඩගු බව නොමැති ...............................................

(ii) කිසිම අර්ථයකට නැති..............................................

20 පහත සඳහන් යුගල පද සම්පූර්ණ කර ලියන්න.

(i) සමිති - ...................................... (ii) ඉඟි - ........................................

(iii) ඇත - ......................................... (iv) ඔප්පු - .........................................

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

01 පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1) ගුණදාස අමරසේකර මහතා විසින් රචිත කෘතියක් නම් කරන්න.

(2) පතසන් අවරගිර නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල
මෙම කවිය ඇතුළත් වන කාව්‍ය කෘතියේ නම සඳහන් කරන්න.

(3) නාම පද ප්‍රභේද දෙකක් සඳහන් කරන්න.

(4) පහත සඳහන් පද යොදා අරුත් පැහැදිලි වන සේ වාක්‍යය බැගින් ලියන්න.

i. ප්‍රදාන

ii. ප්‍රධාන

(5) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
.........................................................................................................
......................................................................................................... (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) එකමුතුව වැඩ කරමු.

(ii) කියවීමේ පුරුද්ද ඉගෙනුමට අත්වැලයි.

(iii) යහපත් සෞඛ්‍යය පුරුදු තුළින් නීරෝගිමත් දිවියක්.

(iv) අසිරිමත් ගම්පියස

(v) සංස්කෘතික උරුමයන් සුරකිමු. (ලකුණු 20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03 පරිසරයට ප්‍රබල ප්‍රශ්නයක්ව පවතින පොලිතින් භාවිතය තුරන් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් මේ වන විටත් ක්‍රියාත්මක වී නැත. මේ සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. (දැන්වීම් පත්‍රිකාව සකසන ඔබ ප්‍රදේශයේ ළමා සමාජයේ ලේකම් යැයි සිතන්න.)

<u>නැතහොත්</u>

අධික වර්ෂාව නිසා ඩෙංගු රෝගය යළි හිස ඔසවා ඇත. ඔබේ පාසලේ සිසුන් කිහිපදෙනෙකු ද මේ වන විට ඩෙංගු රෝගය නිසා රෝහල්ගතව ඇත. ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාගැනීමට ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට පැමිණෙන ලෙස දන්වා යවන ලිපිය සකස් කරන්න. (ඔබ විද්‍යාලයීය ශිෂ්‍ය සමිතියේ ලේකම් යැයි සිතන්න. දිනය, වේලාව අභිමත පරිදි යොදාගන්න.) (ලකුණු 10)

04 (අ) පහත සඳහන් වාක්‍ය සුදුසු වර්තමාන කාල ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කර ලියන්න.

(i) නුඹ සතුටින් කාලය ගත .......................................

(ii) ඔහු බක්කි කරත්තයෙන් කඩමණ්ඩියට .......................................

(iii) සිසුහු විභාගයට හොඳින් සූදානම් .......................................

(iv) ගායිකාවෝ මිහිරි ගීත ගායනා .......................................

(v) නරිනයිදේ පස්ස නොබලා වේගයෙන් කැලයට .......................................

(ආ) පහත සඳහන් වාක්‍ය සුදුසු අතීත කාල ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කර ලියන්න.

(i) නිදා සිටි හාවා ඉබ්බාට .......................................

(ii) ත්‍රස්තවාදීහු පොලීසියට පහර .......................................

(iii) උවැසියෝ පොහොයට සිල් සමාදන් .......................................

(iv) සුන්දරහාමි අහිංසක ලෙස ආගන්තුක සත්කාර .......................................

(v) අම්මා ද මල්ලී ද මම ද ස්වර්ණමාලී මහා සෑය වන්දනා .......................................

(ලකුණු 1 x 10 = 10)

05 පහත සඳහන් ප්‍රකාශ ඇසුරින්, දී ඇති වගුව පිළිතුරු පත්‍රයේ සටහන් කරගෙන නිවැරදි පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න.

(i) ''නෑ නෑ එසේ කරන්න එපා. ඇය පුළුවන් තරම් කාලයක් ඇගේ මෙහෙය ඉටු කළා.''

(ii) ''පලයන් යන්න ..... පොඩ්ඩක්වත් පත්තරේවත් බලන්න නැහැ.''

(iii) ''සීයා කියලා දුන්න දේවල් වගේ ම පුතේ අලුත් අවුරුදු උත්සවයේ දි අපිට වෙනත් ජාතීන්ගෙන් එකතුවුණු දේවලුත් තියෙනවා.''

(iv) ''මේක කාටත් පොරොජන වෙන දෙයක් හරිද?''

(v) ''නෑ නෑ එහෙම වෙන්න බෑ. මෙය ජපානයේ අධිරාජ්‍යයා එවූ පොතක්....''

| | පාඩමේ නම | කීවේ කවුද? | කීවේ කාටද? | කුමන අවස්ථාවේදී ද? |
|---|---|---|---|---|
| i. | | | | |
| ii. | | | | |
| iii. | | | | |
| iv. | | | | |
| v. | | | | |

(ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06 පහත සඳහන් කොටස්වල උපමාව හා උපමේය වෙන් කොට ලියන්න.

(i) වෙන වෙන හොඳ පාට ඇඳුම්
ඇඳගත් පොඩි ළමයි පෙළක්
වගෙයි නේද මේ ගස් ටික
නොයෙක් පාට මල් පිපිලා

(ii) බැස යන හිරු ගිනි බෝලයක් මෙන් ක්ෂිතිජයෙහි දිස්විය.

(iii) මුතු කැට වැනි දසන් දල්වා නංගී සිනාසුනා ය.

(iv) සියලු කරදර බාධක හමුවේ අම්මා මහමෙර මෙන් නොසැලී කටයුතු කළා ය.

(v) සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සනද රෑට (ලකුණු 10)

07 පහත සඳහන් ගීතය කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දාගැබ් මහා වැව් බැන්දේ නුඹයි පුතේ
සීගිරි ගලේ කවි ලීවේ නුඹයි පුතේ
නඟුලෙන් එදා රජ කෙරුවේ නුඹයි පුතේ
පැදුරේ මෙදා නිදියන්නේ නුඹයි පුතේ

අමරස දිව බොජුන් ගිජු කුසයට වළඳා
සිලි සිලි සිනිඳු දිව සළු පිළි හැඳ පළඳා
මහජනයාට වැදි බණ කියමින් බොලඳා
සැප විඳි එකා නිරයට නොයති ද මළ දා

දාගැබ් මහා .........

ඉර හඳ අදත් පායනවා හද අරණේ
මගෙ රට ණයට කැවේ නැහැ නොව පොරණේ
හෙළ දරුවන් එදා මේ සිංහල දෙරණේ
ඔවුනගේ දහදියයි ලද උත්තම සරණේ

ගායනය : විශාරද වික්ටර් රත්නායක මහතා

(i) මෙම ගීතය අයත් වන්නේ කුමන ගී වර්ගයකට ද?

(ii) ගීතයේ සඳහන් පරිදි පුතා කළ සේවාවන් දෙකක් ලියන්න.

(iii) ''නඟුලෙන් එදා රජ කෙරුවේ'' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iv) (අ) ගීතයේ ඇතුළත් විරුද්ධාර්ථවත් පද යුගලය ලියන්න.
(ආ) 'අධම' යන්නෙහි විරුද්ධාර්ථ පදය ගීතයෙන් තෝරා ලියන්න.

(v) පහත සඳහන් පද සඳහා සමානාර්ථවත් පද ගීතයෙන් තෝරා ලියන්න.
(අ) පුරාණයේ
(ආ) කෑදර (ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ii (02) iii (03) iv (04) iv (05) iii (06) i (07) iv (08) iii

(09) ii (10) ii (11) iv (12) iii (13) ii (14) i (15) iv (16) කළෙහු

(17) මිදෙත්වා ! (18) i. නීච / අවච / අනුච්ච ii. කනිෂ්ඨ

(19) i. නිහතමානී ii. නිරර්ථක

(20) i. සමිති සමාගම් ii. ඉඟිබිඟි iii. ඇත මෑත iv. ඔප්පු තිරප්පු

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) සුවඳ, එක්වැමෙන් පොළොවට, රතු රෝස මල, අමල්බිසෝ
    (2) සැළලිහිණි සන්දේශය
    (3) නාම නාම, සර්ව නාම, සමාස නාම, තද්ධිත නාම, කෘදන්ත නාම
    (4) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.
    (5) කඩුල්ලේ තරම දැනගෙන වැට බඳිනු
    තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

02. සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.

03. සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.

04 (අ) 1. නුඹ සතුටින් කාලය ගත කරන්නෙහි.
2. ඔහු බක්කි කරත්තයෙන් කඩමණ්ඩියට යයි.
3. සිසුහු විභාගයට හොඳින් සූදානම් වෙති.
4. ගායිකාවෝ මිහිරි ගීත ගායනා කරති. / කරන්නෝ ය.
5. නරි නයිදේ පස්ස නොබලා වේගයෙන් කැලයට දුවයි.

(ආ) 1. පැරදුණි / පැරදුණේය 2. දුන්හ / දුන්නෝය 3. වූහ / වූවෝය
4. කළේය 5. කළෙමු

05

| | පාඩමේ නම | කීවේ කවුද? | කීවේ කාටද? | කුමන අවස්ථාවේදී ද? |
|---|---|---|---|---|
| i. | සැබෑ ළෙංගතුකම | සිංදු කියන කිරිල්ලී | අධිරාජ්‍යයාට | අධිරාජ්‍යයා කෘත්‍රිම නයිටිංගේල්ව කුඩුපට්ටම් කරනවා යැයි කියූ අවස්ථාව |
| ii. | අවුරුදු සිහිනය | පත්තරය බලමින් සිටි මිනිසා | පියසේනට | පියසේන කොබෝගම ගැන විමසූ අවස්ථාව |
| iii. | අලුත් අවුරුදු උත්සවය | තාත්තා | පුතාට | අලුත් අවුරුදු ක්‍රීඩා ගැන කතා කරන විට |
| iv. | එතනහාමි | සාස්තරකරු | එතනහාමිට හා ඩිංගිරාළට | සාස්තරය කියන අවස්ථාව |
| v. | සැබෑ ළෙංගතුකම | අධිරාජ්‍යයා | යුවරජු ඇතුළු රාජ සභාවට | පොත්වල ඇති සියල්ල සත්‍ය නොවන බව විමසන අවස්ථාව |

06 <u>උපමේය</u> <u>උපමාව</u>

(i) පාට පාට මල් පිපුණු ගස් පෙළ — පාට පාට ඇඳුම් ඇඳගත් ළමයි පෙළ
(ii) බැසයන හිරු — ගිනි බෝලය
(iii) දසන් / දත් — මුතු කැට
(iv) අම්මා — මහමෙර
(v) අහස — නිල්තණකොළ පිට්ටනිය

07 (i) දේශාභිමානී ගීත
(ii) දාගැබ් ඉදි කිරීම / විශාල වැව් බැඳීම / සීගිරි ගලේ කවි ලිවීම / ගොවිතැන් කිරීම
(iii) කෘෂි කර්මාන්තයෙන් රට සශ්‍රීක කළ බව
(iv) (අ) එදාමෙදා (ආ) උත්තම
(v) (අ) පොරණෝ (ආ) ගිජු